වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

தேசிய கல்வி ஆணைக்குழு

National Education Commission

2023

පළමු මහල, බ්ලොක් 05, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07

1ம் மாடி 5ம் கட்டிடத் தொகுதி பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம் கொழும்பு 07

1st Floor, Block 05, BMICH, Colombo 07.

වාර්ෂික වාර්තාව 2023

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වැය ශිර්ෂය 335

සභාපතිතුමාගේ පණිවුඩය



රටතුළ පැන නැගුණු ආර්ථික අර්බුදකාරී වාතාවරණය සමග සමස්ත ශ්‍රී ලාංකිකයින්ට මුහුණදීමට සිදු වූ විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වසර තුළ දී අත්පත් කරගත් කාර්යසාධනය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මම ඉතා සතුටු වෙමි.

අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමේ හා වෙනස්කම් සිදුකිරීමේ අවශ්‍යතාව අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තුළින් හඳුන්වාදෙන ලද ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ඇතුළත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) වාර්තාව පිළියෙල කර ගරු අධ්‍යාපන අමාත්‍යවරයා වෙත සහ ජනාධිපති කාර්යාලය වෙත පිළිගැන්වීමට අවශ්‍ය පියවර ගැනීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමත් විය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතියේ විවිධ අංශ ආවරණය කෙරෙමින් සිදු කරනු ලබන පර්යේෂණවලින් උත්පාදනය වන දැනුම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ කාර්යයන්හි නිරත අනෙකුත් පාර්ශව සහ උනන්දුවක් දක්වන පාර්ශව සමග හුවමාරුකර ගැනීමේ පරමාර්ථයෙන් සංවිධානය කරනු ලබන අධ්‍යාපනය පිළිබඳ පළමු ජාතික පර්යේෂණ සමුළුව, අධ්‍යාපන ක්ෂේත්‍රයේ විද්වතුන් රැසකගේ සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්වීමට සමත් විය.

එමෙන් ම, උසස්පෙළ සමත් සිසුවෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගත කරන කාලයත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා උපාධි අපේක්ෂකයෙකු ගත කරන කාලය අවම කිරීම පිළිබඳවත් ගත හැකි ප්‍රගතිශීලී පියවරයන් පිළිබඳව අධ්‍යයනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග සිදු කරන ලද ද්විපාර්ශ්වික අධ්‍යයනයේ වාර්තාව ද ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පිළිගැන්වීමට කටයුතු කරන ලදී. රටතුළ පවතින ශ්‍රම සම්පත කාලීන වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුකූලවන සේ සකස් කර රටේ ආර්ථිකයට දායාද කිරීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් සිදු කළ යුතු වන ප්‍රතිසංස්කරණයන් මෙම අධ්‍යයනය මගින් හඳුනාගෙන ඇත.

ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරගමන්කරුවෙකු වශයෙන් කටයුතු කරනු ලබන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට, අනේකවිධ බාධාවන් මධ්‍යයේ වුවද, තම රට දැය වෙනුවෙන් ඉටු කළ යුතු වූ කාර්යභාරය අඛණ්ඩව, නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි.



මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2024 ජුනි

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**01-06**
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**07-16**
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	**17-32**
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	**33-34**
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	**35-36**
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	**37-38**
පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව	**39-43**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකගතාවක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිසමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාව පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් ඉහත කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැර වූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2(3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියලු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකු සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 05 දෙනෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පූර්ණ කාලීන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුන්ගෙන් ද කොමිෂන් සභාව සමන්විත වේ.

වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 8 වැනි කොමිෂන් සභාවයි. (2020.02.28 දින සිට)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

දැක්ම

දේශීය හා ගෝලීය අභියෝගවලට මුහුණදීමට අනුගත වූ සාමකාමී, එකමුතු ශ්‍රී ලාංකීය සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රගතිශීලීව සහ ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබන්නාවූ සමාජයක්

මෙහෙවර

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, අදාලත්වය සහ අධ්‍යාපනයේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමේ අදහසින් අධීක්ෂණ සහ සහතික කිරීමේ භූමිකාවන් සමඟ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, ඉලක්ක, නිපුණතා පැතිකඩ සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රමිතීන් සැකසීමේ ප්‍රමුඛතම සංවිධානය ලෙස ක්‍රියා කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටෙක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

1.4 සංවිධාන සටහන

Organizational Structure of National Education Commission



කොමිෂන් සභාවේ සාමාජිකයින්

මහාචාර්ය එච්. අබේගුණවර්ධන
සභාපති

පද්මිණී රණවීර මිය
උප සභාපති (ප්‍රතිපත්ති)

කිංස්ලි ප්‍රනාන්දු මහතා
උප සභාපති (සැලසුම්)

නිල බලයෙන් පත්වුණු සාමාජිකයින්

මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

බී.කේ.යූ. වික්‍රමසිංහ මහතා
සභාපති, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

එම්.එන්. රණසිංහ මහතා
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

චන්දිමා පුංචිහේවා මිය
අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

එම්.එම්. නයිමුඩීන් මහතා
අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

අනෙකුත් සාමාජිකයින්

ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා

හිටපු උප කුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

ආචාර්ය කපිල බණ්ඩාර මහතා

පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා

ළමා ස්නායු විශේෂඥ වෛද්‍ය,
රිජ්වේ ආර්යා ළමා රෝහල

ආචාර්ය ඉන්ද්‍රාණි තලගල මිය

හිටපු අංශ ප්‍රධානී,
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ඩී.එම්.ඒ.ආර්.බී. දිසානායක මහතා

අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය

ආචාර්ය හර්ෂ අලස් මහතා

සභාපති, ගේට්වේ ජාත්‍යන්තර පාසල

ස්වාමිනාදන් විමල් මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව,
යාපනය විශ්වවිද්‍යාලය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර හතරක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු හතරක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
4. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.



සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

1. තිරසාර සංවර්ධන අරමුණු - 4 පිළිබඳව මධ්‍යකාලීන සමාලෝචන වාර්තාව (2023)

සැමට, අන්තර්කරණය වූ සහ සමාන වූ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා යාවජීව ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ යුනෙස්කෝව සඳහා වන කොමිෂන් සභාවේ මගපෙන්වීම සහ ගරු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ නම් කිරීම මත පදනම්ව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මෙම මධ්‍යකාලීන සමාලෝචන වාර්තාව 2023 අවුරුද්ද තුළ කෙටුම්පත් කරන ලදී. මෙහිදී තිරසාර සංවර්ධන අරමුණු 4 ට අදාළව - අනු ඒකක 11 යටතේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳව වර්තමාන සංරචකයන් විග්‍රහකිරීමක් සිදුවිය.

මෙම කාර්යය විද්වත් කමිටුවක මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. මෙහිදී දත්ත එක්රැස් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පාදක කොටගෙන සිදු කරන ලදී. මෙහිදී පළමු කෙටුම්පත සකස් කිරීමෙන් අනතුරුව සෑම අනු ඒකකයක් සඳහාම වෙන් වෙන් වශයෙන් වැඩමුළු පවත්වා එම ලැබුණු ප්‍රතිපෝෂණයන් යොදා ගනිමින් එම කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කරන ලදී. ඉන් අනතුරුව සකසන ලද වාර්තාව 2023 ජූලි මස 12 දින National Validation Workshop ඉදිරිපත් කර එයින් ලැබුණු ප්‍රතිදානයන් ලිඛිතව ලබා ගන්නා ලදී. මෙම වැඩමුළුවේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් ගරු අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සහභාගී විය. එමෙන්ම නවදිල්ලි නුවර යුනෙස්කෝ සංවිධානයේ නියෝජිතයන් ද, අදාළ අමාත්‍යාංශ, ආයතන, රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් ද සහභාගී විය. මෙම සියල්ලේම කරුණු අනුව සංවර්ධනය කරන ලද අවසන් වාර්තාව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවේ මහලේකම් මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මියට හා අමාත්‍යතුමාට 2023 අගෝස්තු 22 දින මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස භාරදෙන ලදී.

2. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් : ආරම්භය, වත්මන් තත්ත්වය සහ අනාගතය

ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සහ නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්වල එක් නිර්දේශයක් වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රමිති සැකසීම සහ අධීක්ෂණ පද්ධතියක් ඇතුළත් තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, මෙම තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණය සකස් කිරීමේ පූර්විකාවක් ලෙස ජාත්‍යන්තර පාසල්වල වත්මන් තත්ත්වය තක්සේරු කිරීමේ අදහසින් ජාත්‍යන්තර පාසල් පිළිබඳ කඩිනම් ඇගයීමක් සිදුකිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තීරණය කරන ලදී. එය ඉටු කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල්වල වත්මන් තත්ත්වය පිළිබඳ සමීක්ෂණය" නමින් අධ්‍යයනයක් ආරම්භ කෙරිණි.

ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රජාව තුළ වැඩි අවධානයක් යොමු වී ඇති ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය විධිමත් නියාමනයකට ලක් කරමින් ගුණාත්මකභාවය රඳවා ගැනීමට අවශ්‍ය පද්ධතිමය අවශ්‍යතාවන් හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි. කොළඹ දිස්ත්‍රික්කය හා ඒ අනුව ස්ථාපිත ජාත්‍යන්තර පාසල් පිළිබඳව අවධානය යොමු කරමින් ක්ෂේත්‍රය තුළ කටයුතු කරනු ලබන විවිධ පාර්ශවකරුවන් සමග සාකච්ඡා පවත්වමින් මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස් කරගන්නා ලදී.

මෙමගින් රජය විසින් කළ යුතු ප්‍රමුඛතම පියවර ලෙස නිර්දේශ කරනුයේ 1960 අංක 5 දරණ උපකෘත පාසල් සහ පුහුණු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 8 දරණ පනත උපකෘත පාසල් සහ පුහුණු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට හෝ නව පනතක් ප්‍රතිස්ථාපනය කිරීම මගින් හිමිකාරිත්වය හෝ අනුබද්ධතාවය නොසලකා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම පාසල් නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට ඉඩ හැරීම සඳහා රජයට අවස්ථාව සැලසීමයි.

දැනට පවතින පනත් දෙක සංශෝධන හෝ අවලංගු කර නව පනතක් ප්‍රතිස්ථාපනය කරන තෙක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව පෞද්ගලික අධ්‍යාපන ශාඛාව සමඟ වෙනම ඒකකයක්/නිශ්චිත අධිකාරියක් ***(ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය සඳහා නිශ්චිත අධිකාරිය)*** ස්ථාපිත කළ යුතු බව නිර්දේශ කෙරේ.

ඉහත අධිකාරිය මෙහෙයවීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව අධ්‍යාපන අමාත්‍යවරයා විසින් උපදේශක කමිටුවක් ***(ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය සඳහා උපදේශන කමිටුව-ACISE)*** පිහිටුවීමට පියවර ගතයුතුය. මෙම උපදේශන කමිටුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් සහ ජාත්‍යන්තර පාසල්, ආයෝජන මණ්ඩලය සහ වාණිජ මණ්ඩලය නියෝජනය වන පරිදි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පත් කරන ලද නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතෙන් නියම කර ඇති පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය සඳහා වූ නිශ්චිත අධිකාරිය සමඟ සම්බන්ධ වී සියලුම ජාත්‍යන්තර පාසල් සඳහා වන තක්සේරු ක්‍රමයක් සමගින් තත්ත්ව ආරක්ෂණය සහ ප්‍රතීතන පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3. ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මගින් සපයනු ලබන රැකවරණය සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් : වත්මන් තත්ත්වය සහ ඉදිරි දැක්ම

ජාතික ප්‍රතිපත්ති රාමුව (2020-2030) හි, මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනාවේ එක් නිර්දේශයක් වන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, ඒවායේ මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය වැඩසටහන් සමාලෝචනය කිරීම සහ සහතික කිරීම සඳහා තත්ත්ව සහතික රාමුවක් සහ ආයතනික යාන්ත්‍රණයක් පිහිටුවීමයි. මෙම සමීක්ෂණයට අදාළව 2022 වසර තුළදී සාකච්ඡා වට කිහිපයක් මගින් සමීක්ෂණ ප්‍රශ්නාවලිය පිළිබඳ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් දැනුවත් කර, නියමිත පරිදි සැකසූ ප්‍රශ්නාවලිය ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරා ගන්නා ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ආයතන 358ක් ඔවුන් වෙත ලබා දී දත්ත රැස්කර ගැනීමෙන් අනතුරුව සමීක්ෂණ කටයුතු අවසන් කරන ලදී. ඉන් පසු එම අධ්‍යනයේ සංක්ෂිප්ත වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සමුළුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සමස්ථ ගුණාත්මකභාවය, ප්‍රමිතිය පෝෂණය කිරීම උදෙසා තත්ත්ව සහතික සහ සහතික කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම මගින් මුල් ළමාවිය අධ්‍යාපනය අධීක්ෂණය විධිමත් කිරීම සඳහා යෝජනා රැසක් මෙම අධ්‍යයනයේ අන්තර්ගත වේ.

4. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ STEM/STEAM ව්‍යවහාරයන්ගේ වර්තමාන තත්ත්වය හා ක්‍රියාත්මක වන ආකාරය

ලෝකයේ බොහෝ රටවල් 21 වන සියවසේ රැකියා වෙළඳපොලේ ඉල්ලුම සපුරාලීම සඳහා කුසලතා ඇති සිසුන් සූදානම් කිරීමේදී STEM/STEAM අධ්‍යාපන ප්‍රවේශය යොදා ගනී. ලංකාව තුළ මෙම අධ්‍යාපන ප්‍රවේශය සම්බන්ධයෙන් යම් ආරම්භයක් ගෙන ඇති නමුත්, තවමත් පාසල් පද්ධතිය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නැත. එම නිසා මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ, STEM/ STEAM ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය සහ ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම වේ.

මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලැබූ බස්නාහිර, මධ්‍යම හා නැගෙනහිර පළාත් අවරණය වන පරිදි තෝරාගත් පාසල් 1051 ක් සඳහා ප්‍රශ්නාවලි ලබා දී දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

එකී දත්ත අනුසාරයෙන් බස්නාහිර, මධ්‍යම හා නැගෙනහිර පළාත් නියෝජනය කරන විෂය අධ්‍යක්ෂකවරු ඇතුළු පාර්ශව සමග සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ STEM/ STEAM ප්‍රවේශයන් සාර්ථකව අනුගමනය කිරීම සඳහා පරිපාලනමය සහයෝගය, අනුකූල ප්‍රතිපත්ති හා විධාන, සුදුසු විෂයමාලා ප්‍රතිසංස්කරණය, ගුරු පුහුණුව සහ සම්පත් ප්‍රතිපාදන, අධ්‍යාපනඥයින් සවිබල ගැන්වීම සඳහා උපායමාර්ගික ප්‍රතිපත්තිවල අවශ්‍යතාව යනාදිය පිළිබඳ අවධානය යොමු කරවමින් අවසන් වාර්තාව පිළියෙල කර ඇත.

5. ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයේ වර්තමාන තත්ත්වය: ගුරුවෘත්තිකභාවය සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ භාවිතයන්

කාලීන වැදගත්කමකින් යුතු අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව පුනරුදය ඇති කිරීමේ මූලික පියවරක් ලෙස දිවයින් පුරා පාසල් නියෝජනය වන සේ ගුරුවරු 2000 නියැදියක් මගින් දත්ත එක්රැස් කරගනිමින් ගුරු වෘත්තිකභාවය ඇති කිරීම සඳහා ඔවුන්ගේ යෝජනා හා නිර්දේශ පිළිබඳව විමසන ලදී. එසේ රැස්කරගත් දත්ත ආශ්‍රය කර ගනිමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන විවිධ පාර්ශව සමග නාභිගත සාකච්ඡා සිදු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රමිතිය ඉහල නැංවීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දීම, ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් උසස් තත්ත්වයේ ඉගෙනුම් අත්දැකීම් ලබාදීමට ගුරුවරුන් වෙත අවස්ථාව ඇති කිරීම තුළින් ගුරු වෘත්තිකභාවය ඉහල නැංවීම සඳහා ගතයුතු පියවර පිළිබඳව මැනවින් අවධානය යොමු කරවමින් අවසන් වාර්තාව පිළියෙල කර ඇත.

6. තිරසාර උසස් අධ්‍යාපනයක් සඳහා, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඩිජිටල්කරණය පිළිබඳ අධ්‍යයනයක්

තිරසාර උසස් අධ්‍යාපනයක් සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොතෙක් දුරට ඩිජිටල්කරණය වී ඇත්දැයි විමසීම උදෙසා ප්‍රශ්නාවලි 6 ක් මගින් දත්ත රැස් කිරීම . ප්‍රශ්නාවලි 6 සඳහා සිසුන් , ආචාර්යවරු , උසස් කළමනාකරුවන් , පරිපාලන නිලධාරීන් , පුස්තකාල නිලධාරීන් , තොරතුරු තාක්ෂණ නිලධාරීන් සහභාගී වූ අතර සමීක්ෂණ කටයුතු 2022 සැප්තැම්බර් අවසාන වනවිට අවසන් කරන ලදී. ඉන් පසු එම අධ්‍යයනයේ සංක්ෂිප්ත වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු, ද්විවාර්ෂික, අධ්‍යාපනය පිළිබඳ ජාතික පර්යේෂණ සමුළුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ඩිජිකල්කරණය හඳුන්වාදීම සම්බන්ධයෙන් ජාතික කතිකාවතක් ඇති කිරීමේ මූලික පියවර ලෙස තිරසර උසස් අධ්‍යාපනයක් සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඩිජිටල්කරණය කිරීම පිළිබඳව අධ්‍යයනය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය හා සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවන්ගෙන් (සිසුන්, ආචාර්යවරුන්, උසස් කළමනාකරුවන්, පරිපාලන නිලධාරීන්, පුස්තකාල නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරින් යන අය) ලබාගත් දත්ත අනුසාරයෙන් මේ වනවිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ඩිජිටල්කරණය සමග කටයුතු කරන මට්ටම පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනය මගින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ඩිජිටල්කරණය කොපමණ දුරට දායක වී තිබේද, එහි වාසි හා අවාසි, මුහුණ දීමට සිදුව ඇති ගැටලු පිළිබඳව අවධානය යොමු කර තිබේ. කාලීන තොරතුරු තාක්ෂණය පාදක කරගත් ලෝකය තුළ ඉදිරි පැවැත්ම සඳහා ඩිජිටල්කරණය අත්‍යාවශ්‍ය වන මොහොතක ශ්‍රී ලංකාව වෙත වැදගත් වන යෝජනා රාශියක් මෙම වාර්තාවේ අන්තර්ගතය.

7. රැකියා වෙළඳපොළ සමඟ විශ්ව විද්‍යාල විසින් නිෂ්පාදනය කරන ලද මානව සම්පත්වල අනුකූලතාව: ගැලපීම්, නොගැලපීම් සහ ඉදිරි මාර්ගය

මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ විශ්වවිද්‍යාල සිසුන් බඳවා ගැනීම සහ උපාධිධාරී ප්‍රතිදාන දත්ත විශ්ලේෂණය කිරීම, උපාධිධාරී රැකියා ප්‍රවණතා, උපාධිධාරී රැකියා අනුපාතය සහ තත්ත්ව සහතික සමාලෝචනයේ (Quality Assurance Review) ප්‍රතිඵල අතර සම්බන්ධය අධ්‍යයනය කිරීම සහ විශ්වවිද්‍යාල උපාධිධාරීන් පිළිබඳ සේවා යෝජකයන්ගේ ආකල්ප පිළිබඳ අධ්‍යනය කිරීමයි.

මෙම අධ්‍යයනය අදියර තුනකින් ක්‍රියාවට නංවා ඇත: අදියර I : ද්විතියික දත්ත විශ්ලේෂණය; අදියර II : තත්ත්ව සහතික (QA) සමාලෝචන වාර්තා සමාලෝචනය; සහ අදියර III : උපාධිධාරීන් පිළිබඳව සේවා යෝජකයන්ගේ ආකල්ප අධ්‍යයනය.

I අදියර : අ.පො.ස. (උ/පෙළ) අධ්‍යයන විෂය ධාරාවන් සඳහා සිසුන් ඇතුළත්වීමේ ප්‍රවණතා, විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම සහ උපාධිය සම්පූර්ණ කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම සහ උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රවණතා අධ්‍යයනය. මෙම කාර්යය සඳහා අවශ්‍ය ද්විතීයික දත්ත, අධ්‍යාපන අමාත්‍යාංශය (MoE), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC), විභාග දෙපාර්තමේන්තුව (DoE), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සහ රාජ්‍ය විශ්වවිද්‍යාල වැනි රාජ්‍ය ආයතන රාශියකින් ලබා ගන්නා ලදී.

II අදියර : රැකියා අනුපාත සහ තත්ත්ව සහතික සමාලෝචනයේ ප්‍රතිඵලය අතර සම්බන්ධය විශ්ලේෂණය කිරීම. මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (QAC/UGC) තත්ත්ව සහතික කවුන්සිලයෙන් ලබා ගත් දත්ත යොදා ගන්නා ලදී. මෙම දත්ත ආශ්‍රයෙන්, අධ්‍යයන වැඩසටහන් සමාලෝචන ප්‍රතිඵල සහ එක් එක් අධ්‍යයන වැඩසටහන්වල උපාධිධාරීන්ගේ රැකියා අනුපාත අතර සම්බන්ධය විශ්ලේෂණය කරන ලදී.

III අදියර : විශ්වවිද්‍යාල උපාධිධාරීන් පිළිබඳ සේවා යෝජකයන්ගේ සංජානනය තක්සේරු කිරීම. මේ සඳහා අවශ්‍ය දත්ත ලංකා වාණිජ මණ්ඩලයේ ලියාපදිංචි, කීර්තිමත් සේවා යෝජකයින් 561 දෙනෙකු වෙතින් (ප්‍රශ්නාවලියක් මගින්) ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දක්වා තිබුනේ සේවා යෝජකයින් 50ක් පමණි.

මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කරන පරිදි, නොගැලපීම් සඳහා මූලික හේතු කිහිපයකි; පළමුව, ජ්‍යෙෂ්ඨ ද්විතීයික මට්ටමේ සිසුන්ට STEM විෂයයන් හැදෑරීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළින් ප්‍රමාණවත්

අවස්ථාවන් නොලැබෙන බැවින් ඔවුන් ඉබේම අ.පො.ස (උ.පෙළ) කලා විෂය ධාරාව හැදෑරීම සඳහා පොළඹවනු ලැබේ. දෙවන මූලික හේතුව වන්නේ කලා උපාධිධාරීන් අතර විරැකියාව තිබියදීත්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විසින් අ.පො.ස (උ.පෙළ) කලා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන් වැඩි ප්‍රතිශතයක් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන වැඩසටහන් සඳහා අඛණ්ඩව බඳවා ගැනීමයි. තුන්වන මූලික හේතුව වන්නේ නූතන සේවා යෝජකයා සොයන රැකියා නිපුණතා සහිත සිසුන් බිහිකිරීමට හැකි පරිදි, විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන වැඩසටහන්වල විෂයමාලා නවීකරණය කිරීමට විශ්වවිද්‍යාල අසමත් වීමයි.

ඒ අනුව, සඳහන් කර ඇති දිගුකාලීන ගැටලු විසඳීම සඳහා තාර්කික සහ ප්‍රායෝගික ප්‍රතිපත්ති හා උපායමාර්ගික ක්‍රියාකාරකම් ඇතුළත් කෙරෙමින් අවසන් වාර්තාව සම්පාදනය කර ඇත.

8. TVET ඩිප්ලෝමාව සහ උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහන් (NVQ 5 සහ 6): ඉල්ලුම සහ සැපයුම, භෞතික සහ මානව සම්පත්, සාර්ථකත්ව අනුපාත සහ සීමාවන්, සහ ඉදිරි මග

වර්තමාන ශ්‍රම වෙළඳපල පිළිබඳව අවධානය යොමු කිරීමේදී නිපුණතා සහිත ශ්‍රමය සඳහා විශාල ඉල්ලුමක් වී ඇත. එකී නිපුණතා සහිත ශ්‍රමය නිර්මාණය කරනු ලබන (NVQ 5 සහ 6) ඩිප්ලෝමා සහ උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහන් සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

තාක්ෂණ විද්‍යාල (CoT) හයක් සහ University College පහක සිසුන් 884ක් නියැදිය ලෙස ගනිමින් දත්ත එක්රැස් කරන ලදී. එකී දත්ත අනුසාරයෙන් NVQ 5 සහ 6 ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ඇතුළත් වන සිසුන්ගේ අධ්‍යයනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට, අදාළ වැඩසටහන් පූර්ණ ලෙස හැදෑරීම දිරිමත් කිරීමට හා මෙම වැඩසටහන් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් දායකත්වයක් ඇති කිරිම වෙනුවෙන් මෙම අධ්‍යයනය හරහා ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ රාශියක් ඉදිරිපත් කර ඇත.

මෙම අධ්‍යයන පර්යේෂණ දත්ත අනුව නිපුණතා මත පාදක වූ ඇගයීම් සඳහා වන ස්වාධීන අධීක්ෂකයින්ගේ පවත්නා දුර්වලතා හේතු කොට ගෙන එය සිසුන්ගේ අසමත් වීම සඳහා හේතුවන හෙයින් එම ඇගයීම් පටිපාටිය වඩාත් විධිමත් විය යුතු බවට යෝජනා කරන ලදී.

එසේම එම ස්වාධීන ඇගයීම් සඳහා දැනට විශාල කාලයක් ගතවන හෙයින් එම කාලය අඩුකර ගත යුතු බවට නිර්දේශ/යෝජනා ඉදිරිපත් කරන ලදී. එමගින් නිසි කාලයේදී පාඨමාලා සහතික පත්‍රය සිසුන්ට ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

සිසුන්ගේ පාඨමාලා හැරයාම අවම කර ගැනීම සඳහා සුදුසු මූල්‍ය ආධාර ක්‍රමයක් හෝ ශිෂ්‍යත්ව ක්‍රමයක් මෙම NVQ 5/6 පාඨමාලා සඳහා රජය මගින් ලබාදීම සිදු කළ යුතු යැයි නිර්දේශ ඉදිරිපත් කර ඇත.

එසේ මෙම NVQ 5/6 පාඨමාලා ඉගැන්වීම සිදු කරන කථිකාචාර්යවරුන්ගේ හිඟතාව අවම කර ගනිමින් විධිමත් ලෙස පුරප්පාඩු පියවා ගැනීමෙන් මෙම පාඨමාලා විධිමත්ව ඵලදායිකව පවත්වා ගත හැකි බවට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

9. අධ්‍යාපනය පිළිබඳ දත්ත ඇතුලත් වාර්තාව සැකසීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ආශ්‍රිත විවිධ දත්ත ඇසුරින් අධ්‍යාපනඥයින්ට, අධ්‍යාපන නිලධාරීන්ට, ගුරුවරුන්ට, සිසුන්ට, විශ්වවිද්‍යාලවලට ආදී වූ බහුවිධ පරිශීලකයින් සහ උනන්දුවක් දක්වන පාර්ශව වෙත පිළියෙල කරන ලද අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යානමය දත්ත සංග්‍රහයක් පිළියෙල කිරීමේ කාර්යය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සාර්ථකව ඉටු කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, UNESCO ආයතනය වැනි ප්‍රමුඛ ආයතනවල පවත්නා දත්ත මූලාශ්‍ර ආශ්‍රය කර ගනිමින් වර්ෂ 2015 සිට 2020 දක්වා වූ දත්ත අන්තර්ගත කරමින් මෙම ප්‍රකාශනය පිළියෙල කර ඇත.

මෙය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. පළමු කොටස මගින් අධ්‍යාපනය පිළිබඳ දත්ත විශ්ලේෂණය හා දෙවන කොටස ශ්‍රී ලංකාවේ ගුරු සේවයේ පිහිටුවීම සහ ස්ථානගත කිරීම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනයක් වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගැනීමට මෙම දත්ත සංග්‍රහය මගින් හැකියාව ලැබේ. මෙම දත්ත සංග්‍රහය පිළියෙල කර අවසන් ව ඇති අතර මුද්‍රණය සඳහා යොමු කර ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ www.nec.gov.lk වෙබ් අඩවිය තුළ Publication වර්ගීකරණය තුළින් මෙම වාර්තා බාගත කර ගැනීමට මහජනතාවට අවකාශය සලසා දී ඇත.

2.2 පවත්නා අභියෝග

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය අභියෝග පහත පරිදි වේ.

- නිසි පහසුකම්වලින් යුතු ස්ථිර කාර්යාලයක් ලබා ගැනීම.
- අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීම.
- කොමිෂන් සභාව විසින් සිදු කරන ලද උසස් ගණයේ ප්‍රතිපත්ති සහ වාර්තා ක්‍රියාත්මක කිරීමට අදාළ අමාත්‍යාංශ/ආයතන විසින් අවශ්‍ය පියවර නොගැනීම.

2.3 ඉදිරි ඉලක්ක

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය ඉදිරි ඉලක්ක පහත පරිදි වේ.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පහසුකම් සහිත නව ස්ථානයක ස්ථාපිත කිරීම.

- ආයතනයේ නව සැලසුම් ඵලදායීව ක්‍රියාත්මක කරලීමට හැකි අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවාගත හැකිවනු පිණිස හා බඳවාගත් නව නිලධාරීන් තවදුරටත් දිගුකාලයක් රඳවාගැනීමට හැකිවන පරිදි බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කරගැනීම හා නිසි පාරිශ්‍රමික දීමනා ගෙවීමට අදාළ අනුමැතීන් ලබාගැනීම.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කිරීමේ අරමුණින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම. එමගින්, දැනට කිසිදු ප්‍රමිති සහතික කිරීමේ හා වලංගු කිරීමේ ආයතනයක් විසින් සිදුකරනු නොලබන; මුල් ළමාවිය අධ්‍යාපනය, ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රමිති නිශ්චය කිරීම හා එම ප්‍රමිතියට අනුකූලව ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කළ හැකි වන පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව බලාත්මක කරමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

පරිච්ඡේදය 03 -වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 ශේෂ පත්‍රය (මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය)

ඒසිඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	තත්‍ය 2023 රු.	තත්‍ය 2022 රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	301,943	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		301,943	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		67,615,000	60,660,000	ඒසිඒ-3
-	තැන්පතු		10,250	31,150	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		746,879	734,606	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**68,372,129**	61,425,756	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**68,674,072**	61,425,756	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		849	824	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		68,673,223	61,424,932	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
33,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	26,908,056	30,408,859	
33,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	32,261,184	26,037,934	ඒසිඒ-2(ii)
500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,327,238	797,888	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
67,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**60,496,478**	57,244,681	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
2,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	313,520	359,180	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
200,000	හැකියා වර්ධනය	14	309,625	-	
8,300,000	වෙනත් මූලධන වියදම්	15	6,057,251	4,026,526	
11,000,000	මුළු මූලධන වියදම් (උ)		**6,680,396**	4,385,706	
	තැන්පතු ගෙවීම්		7,350	14,350	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,489,000	1,496,000	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,496,350**	1,510,350	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		68,673,223	63,140,737	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(0)	(1,715,805)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(180,734)	(1,715,805)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(180,734)	(1,715,805)	ඒසිඒ-3

3.2 – අදාළ නොවේ

3.3 ආදායම් ප්‍රකාශය (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය)

ඒසීඑ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඑ-6	44,506,689.29	44,193,169.29
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම	ඒසීඑ-5/5(ඒ)	2,735,050.00	1,992,928.70
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඑ-3	-	-
මුළු වත්කම්		**47,241,739.29**	**46,186,097.99**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,682,100.00	1,942,878.70
දේපළ පිරියත හා උපකරණ සංචිතය		44,506,689.29	44,193,169.29
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඑ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඑ-4	52,950.00	50,050.00
අග්‍රිම ශේෂය	ඒසීඑ-3	-	-
මුළු වගකීම්		**47,241,739.29**	**46,186,097.99**

පිටු අංක...7......සිට ..34.. දක්වා ඒසීඑ 1 සිට ඒසීඑ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..35.... සිට ..39... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27/02/2024
වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය", පැලවත්ත,
බත්තරමුල්ල.

....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 19.02.2024
එම්. කිංස්ලි ප්‍රනාන්දු
උප සභාපති (සැලසුම්)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහළ, Block 05,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඩබ්. සී. එස්. පී. සිරිවර්ධන
දිනය : 19.02.2024
Accountant
National Education Commission
1st Floor, Block 05, BMICH,
Colombo 07.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		301,943	148,164
අග්‍රිම ලැබීම්		67,615,000	51,488,000
අත්තිකාරම් අයකර ගැනීම්		746,879	719,843
තැන්පතු ලැබීම්		10,250	13,462
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		68,674,072	52,369,469
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		59,048,030	47,599,357
සභනාධාර සහ මාරුකිරීම්		1,327,238	641,060
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		121,210	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		849	21,843
අත්තිකාරම් ගෙවීම්		1,489,000	383,643
තැන්පතු ගෙවීම්		7,350	12,662
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		61,993,676	48,658,565
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		6,680,396	3,710,904
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		6,680,396	3,710,904
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		6,680,396	3,710,904
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		(6,680,396)	(3,710,904)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නොවේ.

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්ථන	67,000,000	67,000,000	60,496,477	90
මූලධන	11,000,000	11,000,000	6,680,396	61

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන)

අදාළ නොවේ.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත රු.,000	ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ හා කාර්යාලීය උපකරණ	44,205,489	44,205,489	-	-
9154	අස්පෘෂ වත්කම්	301,200	301,200		

3.10 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EDU/C/NEC/FA/2023	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2024 මැයි 10 දින

සභාපති,

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 335 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්න වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරියාගේ වගකීම වුවත්, 2022 අප්‍රේල් 26 දින නිකුත් කර තිබූ අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ගමන් සීමා කර තිබියදීත් විදේශීය ගමන් වියදම් වැය විෂයය සඳහා රු.50,000 ක ප්‍රතිපාදන සලසා ගෙන, එම මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයකට මාරු කර ගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සකස් කළයුතු වුවත්, එසේ නිශ්චිත සැලැස්මක් යටතේ ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමේ එකතුව රු.17,185,000 ක් වූ වැය විෂයන් 04 කට අදාලව රු.583,800 සිට රු.2,242,749 ක් දක්වා ප්‍රතිපාදන එනම් සියයට 27 ක සිට සියයට 99 ක දක්වා පරාසයක ඉතිරිවීම් ප්‍රතිශතයක් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුකර ගැනීම එනම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා සිදු කරනු ලබන පරීක්ෂණ හා සංවර්ධනය වියදම් වෙනුවෙන් කොමිෂන් සභාවේ මුළු ප්‍රතිපාදන වලින් සියයට 11 ක් පමණක් එනම් රු.8,300,000 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු.2,242,749 ක ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ඉතිරිවී තිබුණි.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්

අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

4

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 වගන්තිය .	කොමිෂන් සභාවට අයත් සංචිත වාහන 02 ක් පැවතියද ඉන් එක් වාහනයක් සඳහා පමණක් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර තිබුණි.
(ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හා 09/2009 (I) පරිදි	ආයතන ප්‍රධානීන් ඇතුළුව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු බව සඳහන් කර තිබුණ ද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ඇතැම් ඉහළ කළමණාකාරිත්වයේ නිලධාරීන් ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සලකුණු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමේදී, අන්තර්ගත කළ යුතු යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අක්මුදල් සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී කරුණු 2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගතකොට නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය අවසානයට කාර්ය සාධනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 21 වන සියවසට සරිලන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට අදාල වැඩපිළිවෙල සඳහා වසර 30 ක් පමණ පැරණි කොමිෂන් සභා පනත සංශෝධනය කර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණද පනතේ නිර්දේශිත සංශෝධන 2022 ඔක්තෝබර් 05 වන දින අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළද, රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව දැනුම්දී නොතිබීම මත වර්ෂය අවසාන වනවිටත් එම කාර්යය අවසන් කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුලද ඇතුලත්ව තිබූ 2023 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණු කාර්යයන් 07කින් කාර්යයන් 05 ක අවසන් වාර්තා 2023 දෙසැම්බර් 31 දින වන විට මුද්‍රණයට ඉදිරිපත් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) ඊට අමතරව, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත්ව තිබූ කාර්යයන් 10 ක් අතරින් කාර්යයන් 07 ක අවසන් වාර්තා 2023 දෙසැම්බර් 31 දින වන විට මුද්‍රණයට ඉදිරිපත් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඈ) වාර්ෂික පදනමින් අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යාන සංග්‍රහය (Statistical Digest on Education on annual basis) සකස් කර ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා 2023 වර්ෂයේදී රු.1,320,000 ක් වෙන්කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.179,247 ක් වියදම් දරා තිබුණද, සංඛ්‍යාන සංග්‍රහය මුද්‍රණයට ඉදිරිපත් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන අරමුණු 04 ට අදාළ මධ්‍ය වාර්ෂික ප්‍රගති සමාලෝචනය සිදු කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු. 3,883,457 ක වියදමක් දරා ඊට අදාළ කෙටුම්පත් වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඊ) 2022 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත්ව තිබූ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීමේ කාර්යය හා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීමේ කාර්යය, කොමිෂන් සභාව අහෝසි කර රේඛීය අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමේ යෝජනාවක් හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයේ මිලදීගන්නා ලද මූල්‍ය තත්ව ප්‍රකාශණයේ දේපල පිරියත හා උපකරණ තුල ඇතුලත් රු.309,990 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක් 2021 වර්ෂයේදී අලුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත යොමුකර තිබුණ අතර, මේ දක්වා නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් එම වටිනාකම සහිත වත්කමෙහි පැවැත්ම විගණනයේදී තහවුරු නොවීය.

6

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව 2022 වර්ෂයේදී කැසට් රෙකෝඩර් 03 ක් හා 2023 වර්ෂයේදී ඩිජිටල් වොයිස් රෙකෝඩර් 02 ක් ඌණ ලෙස හඳුනාගෙන තිබුණු නමුත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර දෙපාර්තමේන්තු ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබූ ලැප්ටොප් පරිගනකයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 772 ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

තත්ත්වය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	12	10	02
තෘතියික	11	05	06
ද්විතියික	10	07	03
ප්‍රාථමික	12	09	03
එකතුව	45	31	14

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ තත්‍ය කාර්යමණ්ඩලය තුල පුරප්පාඩු 14 ක් පැවති අතර කොමිෂන් සභාව අහෝසි කර රේඛීය අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමේ යෝජනාවක් හේතුවෙන් පුරප්පාඩු පිරවීම තාවකාලිකව අත්හිටුවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇති ඇතුලත් ගණකාධිකාරී තනතුර 2020 අගෝස්තු 26 දින පුරප්පාඩු වූ අතර, එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කිරීමකින් තොරව 2023 නොවැම්බර් දක්වා වසරකට වැඩි කලක සිට වැඩබැලීම සඳහා නිලධාරීන් පත්කර තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව විසින් විගණනයට දන්වා තිබුණේ කොමිෂන් සභාව අහෝසි කර රේඛීය අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමේ යෝජනාවක් හේතුවෙන් පුරප්පාඩු පිරවීම තාවකාලිකව අත්හිටුවා තිබුණු බවයි.

7

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන හා කලමනාකරණ කමිටු

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවතිය යුතු වුවත්, වර්ෂය තුළ රැස්වීම 2ක් පමණක් පවත්වා තිබුණි.

5.2 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව කොමිෂන් සභාවට අදාළ කර ගත හැකි ලෙස හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සභාව විසින් විගණනයට දන්වා තිබුණේ, සභාවේ විෂයපථය වනුයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම වන අතර, එම ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ආයතන විසින් එම ඉලක්ක හා අරමුණු සැකසිය යුතුව ඇති බවයි.

එන්.ඩී. එන්.සී.කුමාරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

8

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

ශීර්ෂය 335

අංකය	විගණන නිරීක්ෂණ	පිළිතුර
2	මූල්‍ය සමාලෝචනය	
2.1	වියදම් කළමනාකරණය (අ)	**එකඟ නොවේ.** වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කර ඇති අතර 03/2022 භාණ්ඩාගාර උපදෙස් ප්‍රකාරව විදේශ ගමන් සීමා කළ යුතු බැවින්, රු. 50,000.00 ක ප්‍රතිපාදනයක් පමණක් මෙම වැය විෂය යටතේ අනුමත කර ගැනීමට කටයුතු කර ඇත. ප්‍රතිපාදන ඉල්ලුම් නොකලහොත් එම වැය විෂය ඉවත්කිරීමට භාණ්ඩාගාරය කටයුතු කරනු ලබන බැවින්, එවිට නිලධාරියෙකුට හදිසි රාජකාරියකට විදේශගත වීම් අවශ්‍යතාවයක් සඳහා වියදම් දැරීමට නොහැකි වනු ඇත.
	(ආ)	**එකඟ නොවේ.** මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම නිවැරදිව සිදුකළ ද, ඒ ඒ වැය විෂයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් යම් ප්‍රමාණයක් ඉතිරිවීම සම්බන්ධ පැහැදිලි කිරීම් පහත පරිදි වේ. I. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අහෝසි කර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන සේවා කම්ටුවක් ලෙස ස්ථාපනය කිරීමට 2022 වර්ෂයේ දෙවන කාර්තුව අග භාගයේ පමණ යෝජනා වූ බැවින්, **වැය විෂය අංක 2102 - ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරන සඳහා වියදම් දැරීම අත්හිටුවන ලදී.** II. 2022 වර්ෂයේ දී ආයතනය සඳහා නව වෙබ් අඩවියක් කිර්මාණය කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් සිටි අතර, රජයේ වියදම් පාලන චක්‍රලේඛ ප්‍රකාරව නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවට ආයතනයේ භාවිතා කරනු ලබන වෙබ් අඩවියම අවශ්‍යතා අනුව වැඩිදියුණු කර පවත්වාගෙන යාමට තීරණය කරන ලද බැවින්, **වැය විෂය අංක 2106 යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා වූ ප්‍රතිපාදනයෙන් යම් ප්‍රමාණයක් ඉතිරිවීම සිදුවිය.** III. 2023 වසර තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කිහිප දෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වීම සහ අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීම මත **එම නිලධාරීන් සඳහා ඇස්තමේන්තු කරන ලද වැය විෂය අංක 1003 යටතේ වන ප්‍රතිපාදන ඉතිරි විය.** IV. අවසන් කරන ලද අධ්‍යයන පර්යේෂණ වාර්තා 2023 දෙසැම්බර් 31 වන විට මුද්‍රණ කටයුතු සඳහා යොමු කර තිබුණි. එම ආයතන වල මුද්‍රණ කටයුතු වල ප්‍රමාදය හේතුවෙන් ඒ සඳහා වූ **වැය විෂය අංක 2507 යටතේ ඒ සඳහා ගෙවීම් ඉදිරි වසරට ගෙනයාම සිදුවිනි.**
	(ඇ)	අවසන් කරන ලද අධ්‍යයන පර්යේෂණ වාර්තා 2023 දෙසැම්බර් 31 වන විට මුද්‍රණ කටයුතු සඳහා යොමු කර තිබුණි. එම ආයතන වල මුද්‍රණ

		කටයුතු වල ප්‍රමාදය හේතුවෙන් ඒ සඳහා වූ වැය විෂය අංක 2507 යටතේ ඒ සඳහා ගෙවීම් ඉදිරි වසරට ගෙනයාම සිදුවිනි.
2.2	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම.	
		එකඟ නොවේ. මෙම ආයතනය සඳහා අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර අභ්‍යන්තර විගණක තනතුරක් ද අනුමතව නොමැත. අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා මෙම ආයතනයේ අභ්‍යන්තර විගණනයක් සිදු කරවා ගැනීමට අප විසින් ඉල්ලීම් කර ඇත. කෙසේ වුවද 2024 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සැකසීමට කටයුතු කරනු ලැබේ.
2.3	නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම	
	(අ)	**එකඟ වේ.** සංචිත වාහන යටතේ වූ අනෙක් වැන් රථයේ රථයේ ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමින් පවතී.
	(ආ)	**එකඟ වේ.** මෙ සඳහා කටයුතු කරමින් පවතී.
3	මෙහෙයුම් සමාලෝචනය	
3.1.1	සැලසුම් කිරීම	2023 ක්‍රියාකාරී සැලැස්ම සමග යාවත්කාලීන කරන ලද ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර සහ අක්මුදල් සැලැස්ම සකස් කර තිබුණි. 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නියමිත ආකෘතියට අනුකූලව 2024 ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
3.1.2	කාර්යභාරයන් ඉටු නොකිරීම	
	(අ)	**එකඟ වේ.** අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව අප ආයතනය දැනුවත් කර නොමැත.
	(ආ) (ඇ)	කාර්යයන් දහයෙන් (10) හතක (7) අවසන් වාර්තා 2023.12.31 ට පෙර මුද්‍රණය සඳහා ඉදිරිපත් කර තිබුණි. එම කාර්යයන් 10 ට ම අදාළ අවසාන වාර්තා මේ වන විට අදාළ ආයතන වෙත යොමු කර ඇත.
	(ඇ)	**එකඟ නොවේ.** වාර්ෂික පදනමින් අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යාන සංග්‍රහය සකස් කිරීම අවසන් කර (පළමු කොටස සහ දෙවන කොටස) අදාළ අවසාන වාර්තා අදාළ අංශ වෙත යොමු කර ඇත.
	(ඉ)	**සාවද්‍ය වේ.** මෙම කාර්ය සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට 98% ක වියදමක් දරා

		ඇත. නිසි පරිදි කාර්ය නිම කර යුනෙස්කෝ ශ්‍රී ලංකා කාර්යාලය වෙත අවසන් වාර්තාව 2023.08.22 දින ඉදිරිපත් කර අවසන්ය.
	(ඊ)	**එකඟ වේ.**
3.2	**වත්කම් කළමනාකරණය**	
	(අ)	වායුසමීකරණ යන්ත්‍රය ආයතනයට ගෙන්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
	(ආ)	**එකඟ වේ.** 2022 හා 2023 භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වූ ඌන භාණ්ඩ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
	(ඇ)	**එකඟ නොවේ.** මු.රෙ. 772 ප්‍රකාරව 2023 නිශ්කාර්ය වත්කම් බැහැර කිරීම යටතේ මෙම ලැප්ටොප් යන්ත්‍රය වෙන්දේසියට ඉදිරිපත් කරන ලදී. නමුත්, අවම මිලට අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් වීම මත ආයතනයේ රදවා ගැනීමට කටයුතු කරන ලදී. 2024 භාණ්ඩ සමීක්ෂණය යටතේ මේ සම්බන්ධව කටයුතු කරනු ලැබේ.
4	මානව සම්පත් කළමනාකරණය	
	(අ) (ආ)	රජය විසින් කලින් කල ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ආයතනයන්ට අනුගත වීමට සිදුවේ.
5	යහපාලනය	
5.1	අභ්‍යන්තර විගණනය	
	විගණන හා කළමනාකරණ කමිටු	**එකඟ වේ.**
5.2	තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම	**එකග වේ.**

එස්.එස්. රෝෂිණී
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

පරිච්ඡේදය 04 - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	75%-89%	50%-74%	50අඩු %
		අදාළ නොවේ		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම

5.1 තිරසාර සංවර්ධන අරමුණු

සැමට එක හා සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග

අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී අදාළ තිරසාර සංවර්ධන (SDG) ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහතික කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 තුළ තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම පාදක කරගත් ප්‍රතිපත්තිමය නිර්දේශ, අන්තර්ගත කර ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විෂයපථය වනුයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම වන අතර, ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ආයතන විසින් එම ඉලක්ක හා අරමුණු සැකසිය යුතුව ඇත.

පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෝෂ්ඨ	12	06	06
තෘතියික	10	04	06
ද්විතියික	10	07	03
ප්‍රාථමික	10	09	01

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයේ බලපෑම

අදාළ නොවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වසරේ අවසන් පුහුණු සැලැස්ම පහත පරිදි වේ.

තෝරා ගත් පුහුණු වැඩසටහන්	ඉලක්කගත කණ්ඩායම	පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ	කාල පරාසය	අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළඟා වීම සඳහා වන යාන්ත්‍රණය
රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	ලේකම්	දැනුම යාවත්කාලීන කර ගැනීම	වසර 01	සමත්වීම
සිංහල ඩිප්ලෝමාව	කළමනාකරණ සේවා නිලධාරී	භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම	වසර 01	සමත්වීම
පශ්චාද් අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	වැඩසටහන් නිලධාරී	අභ්‍යන්තරික උසස්වීම් සඳහා	වසර 01	සමත් වීම
ස්ථාවර වත්කම් පාලන වැඩසටහන	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම/ අභ්‍යන්තරික උසස්වීම් සඳහා	දින 01	සමත් වීම
අත්තිකාරම් බී ගිණුම වැඩසටහන	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 01	සමත් වීම
නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය වැඩසටහන	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 01	සමත් වීම
ලේකම් පරිවයන් පිළිබඳ වැඩසටහන	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 04	සමත් වීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහතිකපත්‍ර පාඨමාලාව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 06	සමත් වීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැඩසටහන	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාල නොවේ	අදාල නොවේ
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		අදාල නොවේ	අදාල නොවේ
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම		අදාල නොවේ	අදාල නොවේ
1.6	වෙනත්	කිසිවක් නැත	කිසිවක් නැත	කිසිවක් නැත
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ	අනුකූල වේ		

	පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොපැවතීම	අභ්‍යන්තර විගණන අංශයක් නොමැතිවීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා මෙම අවශ්‍යතාව සපුරා ගැනීමට කටයුතු කර ඇත.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විමසුම**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොමැත.	ඉහත 4.3 පිළිතුර අදාළ වේ.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම		අදාළ නොවේ	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම		රැස්වීම් වාර 02ක් පවත්වා ඇත.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිදේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම		අදාළ නොවේ	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම		අනුකූල නොවේ.	අක්‍රීය බැංකු ගිණුම් නොමැත.
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම		අනුකූල නොවේ	එවැනි ශේෂ නොමැත
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		අනුකූල නොවේ	හිඟ හිටි ශේෂ නොමැත
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට	අනුකූල වේ.		

	ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම		අදාළ නොවේ.	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම		අදාළ නොවේ.	
15.3	මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

	සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජොෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

වයි.ආර්. හේවාසිලියන්ගේ
වැඩබලන වැඩසටහන් නිලධාරී (මූල්‍ය)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව